ලක්බිම
රන්කෙත
2003 අගෝස්තු 21 බ්‍රහස්පතින්දා
වෙළෙඳ ආර්ථික හා මූල්‍ය පිටුව 13

# 'ජෙනොවේට් ශ්‍රී ලංකා' නමින් නවතම තොරතුරු තාක්ෂණ සේවාවක් ඇරඹේ

**සිංගප්පූරුවේ** ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණ ආයතනයක් වන ජෙනොවේට් සොලියුෂන්ස් පුද්ගලික සමාගම ශ්‍රී ලංකාවේ සයිබර් සොෆ්ට් තොරතුරු තාක්ෂණ ආයතනය සමග ඒකාබද්ධව ජෙනොවේට් ශ්‍රී ලංකා නමින් නවතම තොරතුරු තාක්ෂණ සේවාවක් පිහිටවනු ලැබිය. මේ පිළිබඳව තොරතුරු අනාවරණය කිරීමේ මාධ්‍ය හමුවක් පසුගිය අගෝස්තු 12 වැනි දින කොළඹ වාජ් සමුද්‍රා හෝටලයේදී පැවැත්විණි. එම අවස්ථාවට ශ්‍රී ලංකාවේ සිංගප්පූරු තානාපති වැන් හා හෝ මහතා ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි විය.

වාණිජ හා පාරිභෝගික අමාත්‍ය රවි කරුණානායක, ජෙනොවේට්හි ප්‍රධාන විධායක නිලධාරී ඇන්ටන් රවීන්ද්‍රන්, ජෙනොවේට් කලාපීය අධ්‍යක්ෂ යියෝ කේ බූන් යන මහත්වරුද එම අවස්ථාවට සහභාගි වූහ.




රවි කරුණානායක අමාත්‍යවරයා ඇන්ටන් රවීන්ද්‍රන් මහතා විසින් පිළිගන්නා අයුරු.

ඇතිකරගත් එකඟතාවය හේතුවෙන් ලාංකේය තොරතුරු තාක්ෂණයට සැලකිය යුතු දායකත්වයක් තමන් ඇතුළු කාර්ය මණ්ඩලයට ලබාදිය හැකි බවත් ඉදිරියේදී පරිගණක තාක්ෂණය ලාංකේය සමාජයට හුරුකරවීමට මෙය හොඳ පිටිවහලක් බවත් ඇන්ටන් රවීන්ද්‍රන් මහතා පැවසීය. මෙම තොරතුරු තාක්ෂණ සේවාව ඉදිරි වසර ඇතුළත තවත් ප්‍රධාන නගර තුනකට ව්‍යාප්ත කිරීම ඔවුන්ගේ අදහසයි. මෙම සේවාව මගින් තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික දැනුම, ඒ සම්බන්ධව ඩිප්ලෝමා සහ උපාධි පිරිනැමීමටත් මොවුන් අපේක්ෂා කරයි. ඒ සඳහා ඔවුන් ජාත්‍යන්තර විශ්ව විද්‍යාල කීපයක් සමග එකඟතාවක් ඇතිකරගෙන තිබේ. කේම්බ්‍රිජ්, ලන්ඩන්, දකුණු ඕස්ට්‍රේලියා, සදර්ලන්ඩ් යන විශ්ව විද්‍යාල ඉන් කිහිපයකි.

1997 ඇරඹි ජෙනොවේට් සොලියුෂන්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන කාර්යාලය සිංගප්පූරුවේ පිහිටා ඇති අතර, අනෙකුත් කාර්යාල ඕස්ට්‍රේලියාව, මැලේසියාව, ඉන්දුනීසියාව, කොරියාව සහ ඉන්දියාව වැනි රටවල පිහිටා තිබේ. තොරතුරු තාක්ෂණය සහ පරිගණක පුහුණුව ලැබූ අති දක්ෂ සේවක පිරිසක් මෙම සමාගමේ සේවයේ යෙදී සිටිති. මොවුන් ඒකාබද්ධ වූ සයිබර් සොෆ්ට් සමාගම 1996 වසරේදී ආයෝජනය මණ්ඩල අනුග්‍රහය යටතේ ඇරඹි සමාගමකි.

මධුර සෙනෙවිරත්න
ඡායාරූපය: කුමුදු කාරියවසම්

VYA Public Relations (Pvt) Ltd.
3A De Vos Avenue, Colombo 4, Sri Lanka
Tel: 94 1 500 333 Fax: 94 1 590 233
E-mail: vya-pr@celltelnet.lk

Scanned by CamScanner